# සත්ත්ව රූප ඇතුළත් සුවිශේෂ සාම්ප්‍රදායික සැරසිලි



නිපුණතාව 7.0 : දේශීය, විදේශීය ඓතිහාසික චිත්‍ර, මූර්ති, කැටයම් හා ගෘහ නිර්මාණ කලාවන් හා අනන්‍යතා හඳුනාගෙන ඒවායේ කලාත්මක ලක්ෂණ නිර්මාණකරණයේ දී භාවිතයට ගනියි.

නිපුණතා මට්ටම 7.2 : දේශීය සාම්ප්‍රදායික සැරසිලි මෝස්තර භාවිත කරමින් අධ්‍යයනය කරයි.



- වෘෂභ කුඤ්ජරය, කිහිඹි මුහුණ, මකර රුව හා යාලි රුව යනාදී  සුවිශේෂී සාම්ප්‍රදායික සැරසිලි නිර්මාණ පිළිබඳ ව මෙහි දී අවධානය යොමු කෙරේ.
- මෙම සැරසිලි නිර්මාණ බොහොමයක් සත්ත්ව රූප ඇසුරින් නිර්මාණය කර ඇත.
- පැරණි බිතුසිතුවම් ,කැටයම් අතර මෙම සුවිශේෂ නිර්මාණ දක්නට ලැබේ.
- දකුණු ඉන්දීය දේවාලය ආශ්‍රිත ව හමුවන යාලි රුව ශ්‍රී ලංකාවේ මකර රුවට බෙහෙවින් සමානත්වයක් දරයි.
- මෙම නිර්මාණ මඟින් පැරණි නිර්මාණ ශිල්පියාගේ රූප සම්පිණ්ඩනය පිළිබඳ ඥානය හෙළිවේ.

# වෘෂභ කුඤ්ජරය



ඇතුට පොරට ගොනු අර ඇද සිටින්නා
මුඛය පත් විදා මොල්ලිය අඳින්නා
ඇතුගෙ දත් දෙකයි ගොනු අඟට වන්නා
වෘෂභ කුඤ්ජරය අඳු ලකුණු දන්නා



- මුහුණට මුහුණ ලා සිටි ඇතකුගේ ත් ගොනකුගේ ත් හිස් එකට සම්පිණ්ඩනය වන සේ වෘෂභ කුඤ්ජරය නිර්මාණය කර ඇත.
- ගොනාගේ අං දෙක ම ඇතාගේ දළ දෙක වශයෙන් යොදා ඇත. ඇතාගේ හොඬවැල ගොනාගේ මොල්ලිය ලෙස පෙනේ. සතුන් දෙදෙනාගේ ම ඇස් එක ය.
- මෙම නිර්මාණයෙන් එකල ශිල්පියාගේ නිර්මාණාත්මක හැකියාව මනාව පෙනේ.

# වෘෂභ කුඤ්ජරය

- කුරුණෑගල රිදී විහාරය, මහනුවර දළදා මාළිගය, ඇම්බැක්ක දේවාලය ආදී ස්ථානවල වෘෂභ කුඤ්ජර චිත්‍ර හා කැටයම් දක්නට ලැබේ.






- දෝව රජමහා විහාරයේ වෘෂභ කුඤ්ජරය දක්වා ඇත්තේ බිහිසුණු ලෙස සටන් වැදී සිටින ඇතකු හා ගවයකු ලෙස ය.



# කිහිඹි මුහුණ









- කීර්ති මුබ යනුවෙන් ද හැඳින්වෙන්නේ කිහිඹි මුහුණ යි.
- මකර තොරණෙහි දෙපස ඇති මකර රූප දෙක මැදින් කිහිඹි මුහුණ පිහිටයි.
- කිහිඹි මුහුණෙහි කට විශාල ය. රතු තොල් සහිත ය.
- දෙපස දළ දෙක සමඟ දෙපසට විහිදී කරකැවී ගිය අලංකාර ලියපත් නිර්මාණයකි. විශාල දෙනෙත් පහතට නැඹුරුව විශාල ව ඇත.
- කිහිඹි මුහුණ පිළිබඳ ව විවිධ මිථ්‍යා ප්‍රබන්ධ රාශියක් ඇත.

# මකර තොරණ















# යාලි රුව

- යාලි යනු පුරාණෝක්තිගත නිර්මාණාත්මක සත්ත්වයෙකි.
- බොහෝ හින්දු කෝවිල්වල මෙය දැකිය හැකි ය.
- බොහෝ විට මෙය ස්තම්භ හෝ කුලුනු මත ආධාරක මූර්තියක් ලෙස නිර්මාණය කර තිබේ.
- යාලි රූපය නිර්මාණය කිරිම සඳහා හස්තියා, සිංහයා, අශ්වයා යනාදි සතුන්ගේ කොටස් භාවිත කර ඇත.
- විවිධ ස්ථානයන්හි සතුන් දෙදෙනෙක් හෝ තුන්දෙනෙක් හෝ වශයෙන් විවිධ සත්ත්ව කොටස් එකතු කර කල්පිත රූපයයක් ලෙස යාලි නිර්මාණය කර ඇත.
- යාලි රුව යෙදීම මඟින් කෝවිලක ආරක්ෂාව සංකේතවත් විය. එම සතුන්ගේ ශක්තිවන්ත බලසම්පන්න ස්වභාවය මඟින් එය තව දුරටත් තහවුරු වී ඇත.
- කෝවිල් ආශ්‍රිත කලා නිර්මාණයක් වන මණ්ඩපම්හි අලංකාර යාලි රූප දැකිය හැකි ය.
- යාලි බොහෝ පෞරාණික නිර්මාණයක් වුවත් කලා නිර්මාණයක් ලෙස වැඩි වශයෙන් යොදාගෙන ඇත්තේ දකුණු ඉන්දීය මූර්ති කලාව තුළ යි.









පහත ප්‍රශ්ණ වලට පිලිතුරු සපයන්න

01. ඔබ ඉගෙනගත් සත්ත්ව රූප ඇතුළත් සුවිශේෂ සාම්ප්‍රදායික සැරසිලි නිර්මාණ නම් කරන්න.

02. ඒවායේ ඇති කලාත්මක ලක්ෂණ හා එම නිර්මාණවල ඇති සුවිශේෂතාව පැහැදිලි කරමින් වාක්‍ය 05 බැගින් ලියන්න.

03. එම නිර්මාණ හමුවන ස්ථාන නම් කර මෙම නිර්මාණ මගින් පැරණි ශිල්පියාගේ රූප සම්පිණ්ඩනය පිළිබඳ ඔබට සිතෙන කරුණු අනුව පුවත්පතකට ලිපියක් සකස් කරන්න.